## 4. ශීර්ෂය 4 - උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු

### 4.1 විගණන විෂය පථය

උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 07 දින රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**---------------------------------------------**

කාර්යාලය විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා පරිගණක මුද්‍රකාංග ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ)** **අයවැය විචලනය**

**------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබූ රු.2,700,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**4.4** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------**

**4.4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**-----------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2014 සැප්තැම්බර් 16 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.4.2** **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**4.4.3** **අභ්‍යන්තර විගණනය**

**-----------------------**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------------**

2013 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.5 කාර්යසාධනය**

**-----------------**

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු කාර්යාලය විසින් 2013 ජනවාරි 01 දින වන විට විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව 3,173 ක් වූ අතර, 2013 වර්ෂයේදී අලුතින් ලියාපදිංචි වූ නඩු සංඛ්‍යාව 1,654 ක් වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේදී විසඳීමට තිබුණු මුළු නඩු සංඛ්‍යාව 4,827 ක් විය. මෙම නඩු සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී නඩු 1560 ක් අවසන් කර තිබුණු බැවින් 2013 දෙසැම්බර් 31 දින වන විට විසඳීමට තිබුණු නඩු සංඛ්‍යාව 3,267 ක් වී තිබුණි.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 20 | 03 |
| **එකතුව** | **23** | **20** | **03** |